

**සමන් දෙවියන්ගේ ඇරැයුමෙන් බුදුරජාණන් වහන්සේ සමනල පව්ව මත සිරිපා සටහන් තැබූ වගයි...**

චිත්‍ර ශිල්පී - සොයිලියස් මැන්දිස්

## ⁂ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නාහිමි

බුදුදහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම් දැනුම ලබන සිසුන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් විශේෂාංගයක් ලෙස මෙය හැඳින්විය හැකිය.

## ⁂ දුර යන සිත නවතා ඉර බැම් බිඳිමු

– දිවියාගහ යසස්සි නා හිමි

‘සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්’ විශේෂාංගය යටතේ මනසෙහි ස්වභාවය හා එය හික්මවා ගැනීමෙන් ලබාගත හැකි විමුක්තියේ ස්වභාවය පිළිබඳ විග්‍රහයක් ඇතුළත් ලිපියකි.

## ⁂ බොදු බැතිය පිරී හදවතින් සිරිපා කරුණා කරමු

– විතාරන්දෙණියේ වජිරවංස හිමි

උඳුවප් පෝය දිනයෙන් ඇරැඹෙන සිරිපා වන්දනාව පිළිබඳව ලිපියකි. සිරිපා වන්දනාවේ ඉතිහාස තොරතුරු සහ එය සිදුවිය යුතු නිවැරැදි පිළිවෙත පහදා දීමට දරන උත්සාහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ⁂ ජේතවනාරාම පින්බිම පිහිටි සැවැත්නුවර

– සිරිසමන් විජේතුංග

භාරතයේ ඓතිහාසික ජේතවනාරාම පූජ්‍ය භූමිය පිහිටි සැවැත්නුවර පිළිබඳ ශාසන ඉතිහාසගත තොරතුරු සහ එහි වත්මන් තත්ත්වය මෙම ලිපියෙන් විස්තර කැරේ.

## ⁂ බුදුදහමේ ඉගැන්වෙන භාවනා ක්‍රමය පුද්ගලයාගේ ප්‍රඥාව අවදි කරවනවා

– පිටිදූවේ සිරිධම්ම හිමි

මිනිසාගේ ස්වාධීන බුද්ධි කෞශල්‍යය පදනම් කොටගෙන සිත හා නුවණ වඩන බෞද්ධ භාවනා ක්‍රම තුළ දක්නට ලැබෙන සුවිශේෂතාව ප්‍රඥව අවදිකරන උපාය මාර්ගයක් වශයෙන් බෞද්ධ භාවනා ක්‍රමවල වැදගත්කම.

## ⁂ සමාජ සංවර්ධනයට නිවැරැදි මාවත මැදුම් පිළිවෙතයි

– කිරින්දේ සරණංකර හිමි

බුදුදහමේ දැක්වෙන ‘මැදුම් පිළිවෙත’ පිළිබඳ සංකල්පය පුද්ගල විමුක්ති සාධක මාර්ගයක් ලෙස පමණක් නොව සමාජ සංවර්ධනය සඳහා ද වැදගත් දායකත්වයක් දරන බව.

## ⁂ ඔබේ චරිතය ධර්මානුකූලව හඳුනාගන්න

– නාලන්දේ විමලවංශ හිමි

සමථ භාවනා ආදී පිළිවෙත් ප්‍රගුණ කිරිම සඳහා අවශ්‍ය බුදු වදනෙන් හඳුන්වා දී ඇති පුද්ගල චරිත වර්ගීකරණය පිළිබඳ විමසුමකි. භාවනාවට පිවිසීමට පෙර – තමන්ගේ චරිතය නිවැරැදි ලෙස හඳුනාගැනීම සඳහා අවශ්‍ය ධර්මානුකූල මගපෙන්වීම හෙළිදරව් කරගැනීමට දරන උත්සාහයකි.

## ⁂ බුදුරදුන්ගෙන් දෙවියන්ට පිළිතුරක්

– කහවත්තුගොඩ විමලධම්ම හිමි

දෙවිවරුන් පිරිසක් අතර ඇති වූ දහම් ගැටලුවක් නිරවුල්කිරීම් වශයෙන් බුදුරදුන් විසින් දේශිත ගැඹුරු අරුතක් ඇතුළත් වැදගත් ගාථා පාඨයකට අර්ථ විවරණයකි. ජීවිතයේ විවිධ ජයග්‍රහණ ලැබීම පිළිබඳ උනන්දුවන වත්මන් තරගකාරී සමාජයට සැබෑ දිනීම් කවරේදැයි පහදා දෙන වැදගත් ධර්මෝපදේශයකි.

## ⁂ බෞද්ධ සමාජ දර්ශනය

– මහාචාර්ය කේ. එන්. ජයතිලක

වත්මන් ලෝකයේ අසන්නට ලැබෙන විවිධ සංකීර්ණ සමාජ දර්ශන අතර පූර්ණ සංවර්ධිත සමාජයක් ගොඩනැගීම සඳහා බුදුරදුන් විසින් දේශනා කරනු ලැබූ සමාජ දර්ශනය නිරවුල් කරගැනීමට දරන ප්‍රයත්නයකි මෙම ලිපිය.

## ඎ බුදුදහම දකින ශ්‍රද්ධාව

– පහළගම ධම්මික හිමි

බෞද්ධ විමුක්ති පිළිවෙතෙහි මූලික අංගයක්වූ ‘ශ්‍රද්ධාව’ පිළිබඳ විමර්ශනයකි. දහමෙහි දැක්වෙන ආකාරයට ශ්‍රද්ධාව යනු නැණැසින් ජීවිතය පිළිබඳ ඇති වන දැකීමක් මත හටගන්නා පැහැදීමක් බවයි ලේඛකයා පවසන්නේ.

## ඎ සෝම හිමියනි යළි වඩිනු මැනවි ...

## ඎ බෞද්ධ සමාජ දුර්වලතා මූලධර්මවාදීන්ට ශක්තියක්

– ඒ. ඒ. ජයරත්න

ශ්‍රී ලංකාව තුළ විවිධ වෙනත් ආගම් ප්‍රචලිත කිරීමට විවිධ අන්‍යා– ගමික පිරිස් දරන උත්සාහයේ ස්වභාවය, බෞද්ධ සමාජය තුළ පවතින විවිධ දුබලකම් උපයෝගී කොටගෙන එම ආගමික කොටස් තමන්ගේ මතවාද පතුරුවා හැරීමට ක්‍රියාකරන අයුරු.

## ඎ Teachings on the mind

**by Ven. Boralesgamuwe Pemaratana**